# ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව

## කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය

# ඇබෑර්තු

ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ පහත සඳහන් රැකියා ප්‍රභේදයන් සඳහා සුදුසුකම්ලත් පුද්ගලයන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

## (01) ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ - (HM 1-1)

**සුදුසුකම් :**

**බාහිර :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් විද්‍යාව හෝ කෘෂිකර්මය පිළිබඳ ප්‍රථම උපාධියක් සහ අදාළ ක්ෂේත්‍රයෙහි පශ්චාත් උපාධි සුදුසුකම් (මාස්ටර්ස්) සමග සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක අවම වශයෙන් වසර 15 ක කළමනාකරණ මට්ටමේ පළපුරුද්ද

හෝ

අදාළ ක්ෂේත්‍රයේ ආචාර්ය උපාධියක් (Ph.D) සමග ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරියෙකු ලෙස අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවය

**අභ්‍යන්තර :**

විද්‍යාව හෝ කෘෂිකර්මය පිළිබඳ අදාළ විෂය සංයුක්තය සමග ප්‍රථම උපාධියක් සහ අදාළ ක්ෂේත්‍රයේ වසර 02 ක පශ්චාත් උපාධි පර්යේෂණ උපාධියක්

සහ

අදාළ ක්ෂේත්‍රයේ ආචාර්ය උපාධියක් (Ph.D) සහ SLCARP හි ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරියෙකු ලෙස අවම වසර හතරක (04) සතුටුදායක සේවය

හෝ

ජ්‍යෙෂ්ඨ අධ්‍යයන හා පර්යේෂණ ප්‍රභේදයේ, "**ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී**" තනතුරක අවම වශයෙන් වසර අටක (08) සතුටුදායක සේවය.

**සැ. යු.** පිළිවෙලින් ඒ ඒ ශික්ෂණයට අදාළ පර්යේෂණ ප්‍රකාශන කර තිබීම අමතර සුදුසුකමක් වේ.

**සේවක ප්‍රභේදයේ වැටුප් කේතය හා මාසික වැටුප් පරිමාණය :**

★HM 1-1 2025 රු. [140,640 - 15 X 4,100 - රු. 202,640/-]

(කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ 01/2025 මත පදනම්ව වැටුප් ගෙවනු ලැබේ)

**වයස :** වයස අවුරුදු 35 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 50 ට නොවැඩි විය යුතුය. ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්ට අදාළ නොවේ.

## (02) කළමනාකරණ සහකාර - තාක්ෂණික - (MA 2-2)

**තාක්ෂණ නිලධාරී (පරිගණක මෘදුකාංග)**

**සුදුසුකම් :**

**බාහිර :**

අදාළ විෂය සංයුක්තයෙහි, අ.පො.ස. (උ/පෙ) විද්‍යා විෂය ධාරාවෙන් එකවර විෂයන් තුනක් සමත් වී තිබීම සහ ගණිතය, විද්‍යාව සහ භාෂාව (සිංහල / දෙමළ) ඇතුළුව විෂයන් හතරකට (04) සම්මාන සාමාර්ථ සහිතව අ.පො.ස. (සා/පෙ) එකවර විෂයන් හයකින් සමත් වී තිබීම

සහ

පිළිගත් ආයතනයකින් ලබාගත් N.V.Q. මට්ටම 05 ට නොඅඩු අදාළ ක්ෂේත්‍රයේ ඩිප්ලෝමාවක්

**අභ්‍යන්තර :**

ඉහත පරිදිම වේ.

සේවක ප්‍රභේදයේ වැටුප් කේතය හා මාසික වැටුප් පරිමාණය :

★ MA 2-2 - 2025 රු. (50,540 - 10 x 540 - 7 x 630 - 4 x 1,080 - 20 x 1,280 - 90,270]

**වයස :** වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්ට අදාළ නොවේ.

**අයදුම් කළයුතු අන්දම :**

අවශ්‍ය තොරතුරු සහිත අයදුම්පතක්, අධ්‍යාපනික, වෘත්තීය සුදුසුකම්වලට හා සේවා පළපුරුද්දට අදාළ සහතික පිටපත් සහ ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් සමග 2025.06.13 වන දින හෝ ඊට පෙර ලැබෙන පරිදි, ලේකම් / අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව, අංක 114/9, විජේරාම මාවත, කොළඹ 07 වෙත ලියාපදිංචි තැපැල මගින් එවිය යුතුය.

රාජ්‍ය අංශයේ සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ අයදුම්පත්, ඔහු / ඇය අයදුම් කරනු ලබන තනතුරට තෝරා ගතහොත් ඔහු / ඇය මුදා හැරිය හැකි බව දන්වමින් අදාළ ආයතන ප්‍රධානීන් මගින් නිසි ක්‍රමවේදය අනුව ඉදිරිපත් කළ යුතුය.

අයදුම් කරනු ලබන තනතුර ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය. ඉහත අවශ්‍යතාවයන්ට අනුකූල නොවන අසම්පූර්ණ සහ අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනට පසුව ලියාපදිංචි තැපැලෙන් ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

**ලේකම් / අධ්‍යක්ෂ,**
**ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව,**
**අංක 114/9, විජේරාම මාවත,**
**කොළඹ 07.**